

කුමර දිවිය

# මගේ පිනට ඇත මැණිකක් තැනක සඟවලා!



රසික සූරියආරච්චි

මා කුමර දිවිය අවසන් කරමින් සිටි අවදියේ, එනම් කණිෂ්ඨ විද්‍යාලයේ අවසාන වසර ගතකරමින් සිටි කාලයේ, එක් දිනයක සිනමාපටයක් බලන්නට මට අවස්ථාව ලැබුණි. ප්‍රහසනයක් වූ එහි නම "ලොකුම හිනාව" විය.

දැනට වසර හතලිස් දෙකකට පමණ පෙර මා නැරඹූ ඒ සිනමාපටය පිළිබඳ මගේ මතකයේ රැඳී ඇත්තේ කරුණු ස්වල්පයක් පමණි. එහි එක්තරා දර්ශනයක දී මිනිසුන් දෙදෙනෙක් පාන් සාදන බේකරියක් ඇතුලේ පාන් පිටි මිශ්‍රණය ඇඟ පුරා ගා ගනිමින් සටන් වැදුණා මට මතකය. ෆ්‍රෙඩී සිල්වා ගේ "පරණ කෝට්" නම් අද ද ජනප්‍රිය ගීතය ගයමින් කවුදෝ පාරක් දිගේ ගමන් කරනවා ද මගේ මතකයේ මතකයේ ඇත.

ඒ සියල්ලටම වඩා මගේ සිත් ගත් දර්ශනය වූයේ මේ සිනමාපටයේ ආ පෙම් ගීතයකි. එහි ස්ථායි කොටසේ අවසාන පදය වූයේ මේ සටහනේ මාතෘකාව ලෙස මා යොදා ඇති " මගේ පිනට ඇත මැණිකක් තැනක සඟවලා" යන්නයි.

සිනමාපටයේ ඒ දර්ශනයේදී පෙම්වතා මගේ පිනට ඇත මැණිකක් තැනක සඟවලා යනුවෙන් ගයද්දී පෙම්වතිය සිතන්නේ ඒ ඇය පිළිබඳ ගැයෙන ගීතයක් ම ය කියා පෙනුණාද, පෙම්වතා ඇත්තටම අදහස් කරන්නේ ඔහු සොරා ගන්නට ආ මැණිකකි.
පොළව යට තිබී හමුවෙන මැණික් සෑදෙන්නේ කෙසේදැයි අපට කියා දුන්නේ තාත්තාය. ඒ වසර මිලියන ගණනාවක් තිස්සේ පොලොවේ ඇති විවිධ පාෂාණ අධික උෂ්ණත්වයකට සහ පීඩනයකට ලක්වීමෙනි. ලංකාවේ හමුවෙන මැණික්වලටත් වඩා වටිනා වෙනත් පාෂාණ



වර්ගයක් වන දියමන්ති ගැන ද ඔහු අපට කියා දුන්නේය. එකල පැවති පොදුමතය වූයේ පොළොවට යටවෙන ගස්කොලන්වලින් ගල් අඟුරු සෑදෙන ක්‍රියාවලියේම දීර්ඝ කාලීන ප්‍රතිඵලයක් ලෙස දියමන්ති සෑදෙන බවයි.

ඒ අසන ජීවිතයේ කුමර දිවියේ දහවෙනි වසර ගෙවන දරුවෙකුගේ සිතේ තමන්ට ම දියමන්ති සාදා ගන්නට බැරිදැයි යන

*<u>අනාගතයේ කෙදිනක හෝ මේ වල හාරා අපේ පරීක්ෂණයේ ප්‍රථිපලය ලෙස එහි දියමන්තියක් සෑදී තිබේදැයි සොයා බැලීමට අපි එදින සිතා ගත්තෙමු.</u>*

සිතුවිල්ල ඇතිවීම පුදුමයක් නොවේ යැයි සිතමි.

එලෙස ඉපදුණු ඒ සිතුවිල්ල ක්‍රියාවට නැංවීම ද ඉතා ලේසි කටයුත්තක් විය. මල්ලී සමග එකතුවුණු මා කළේ, අප එවකට වාසය කළ පියාගේ මහගෙදර මිදුලේ එක් පසෙක පිහිටි ලොවි ගහ යට කුඩා වලක් හාරා, හොඳ සවිමත් ලී ඉන්නකින් අඩියක පමණ කොටසක් කපා වල දැමීමයි. වලට උඩින් හෙඳින් පස් දමා හැකි තරම් තැලීමටද අපි අමතක නොකළෙමු. ඒ උපරිම පීඩනය ලබා දෙනු පිණිසය.

කෙදිනක හෝ අනාගතයේ දිනක මේ වල හාරා අපේ පරීක්ෂණයේ ප්‍රථිපලය ලෙස එහි දියමන්තියක් සෑදී තිබේදැයි සොයා බැලීමට අපි එදින සිතා ගත්තෙමු.

කාලය ගලා ගියේය. එයින් වසර පහලොවක් පමණ ගතවන විට අප ඒ පෙදෙසින් නික්ම කොළඹ දිස්ත්‍රික්කයේ පදිංචියට ගියෙමු. දියමන්ති නිපදවීමේ පරීක්ෂණය ගැන මතකය කෙමෙන් අපේ සිත්වලින් ගිලිහී ගියේය.

දැන් ඒ මහ ගෙදර තිබූ වත්ත කැබලිවලට බෙදී විකිණී ගොස් ඇත. නිවස ද කැඩී බිඳී ගොස් තිබී අවසානයේ ලීවලට විකිණී ගොස්ය. මින් වසර කිහිපයකට පෙර ඒ පෙදෙසට ගිය මා දුටුවේ නිවස තිබූ තැන දැන් ඇත්තේ පස් කන්දක් පමණක් බවත්, මා පෙර කී ලොවි ගහ තිබුණු ස්ථානයක්වත් අවට වැවී ඇති පඳුරු යනාදිය නිසා සොයා ගත නොහැකි බවත්ය. ඒ කෙසේ වෙතත්, එදා ඒ මොහොතේ මේ දියමන්ති නිෂ්පාදන පෙර දිනයක අප කළ පරීක්ෂණය පිළිබඳව මට සිහිපත් වූයේ ද නැත.

යළි කෙදිනක හෝ ඒ ප්‍රදේශයට ගොස් හොඳින් ස්ථානය සොයා බලා හාරා ගොඩ ගන්නාක් තෙක් මගේ පිනට ඒ ස්ථානයේ දියමන්තියක් සැඟවී ඇති බවට විශ්වාසයක් මගේ සිතේ දැන් ගොඩනැගෙමින් පවතී!


Celebrating
2003 10 Years 2013
AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory

THE LEADING AUSTRALIAN MIGRATION LEGAL ADVISORY FIRM IN SRI LANKA

"You have kept trust on us because we delivered results in simple Immigration matters to most complicated Immigration legal matters. In Australia we have won appeals and still winning. It is the spirit of our team. Our team of lawyers and consultants are either qualified in Australia or Sri Lanka and we are committed with absolute confidence, honesty to deliver results to you"



Susantha Katugampala - LL B (Monash) Barrister & Solicitor in Australia
Chairman
Fairfields Lawyers Australia
Australia Gateway Sri Lanka

Accredited Immigration Law Specialist

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE
10 Morrison Place East Melbourne Victoria 3002 Australia
T : +61 3 9650 4557 F : +61 3 9650 4559 M : +61 417 851 041
info@fairfieldslawyers.com

AUSTRALIA GATEWAY
No. 602 Level 6 Jaic Hilton Towers, Colombo 2 Sri Lanka
T : +94 112 300627 M : +94 777 347670 M : +94 717 347670
admin@australiagateway.com

We Deliver Results...